**ශ්‍රී ලංකා පදනම - 2021**

**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

ශ්‍රී ලංකා පදනමේ 2021 දෙසැම්බර් දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය , ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය පදනම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, පදනම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වය අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ප්‍රමිත අංක 01 හි 48 වන වගන්තිය අනුව ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම් හිලව් නොකළ යුතු වුවද සොරා ගන්නා ලද බවට නිශ්චය කරන ලද රු. 189,588 ක් වූ භාණ්ඩවල වටිනාකම විකුණුම් ලෙජරයේ නිරවුල් නොකළ ශේෂයට හිලව්කර තිබුණි. | සොරකම් කරන ලද භාණ්ඩවල අගය පවත්නා වර්ෂයේදී නිශ්චිතව හඳුනා නොගත් ආදායම් ලැබීම් අවිනිශ්චිත ගිණුමේ සඳහන් කර ඇත්තේ 2022 වර්ෂයේදී නිවැරදි කර අදාළ ගිණුම්වලට ගැනීම සඳහාය. හඳුනා නොගත් ආදායම් හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාළ ප්‍රමිතිය අනුව කටයුතු කල යුතුය. |
| (ආ)සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සමුච්චිත අරමුදල සහ ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය පිළිවෙළින් රු. 31,020,455 ක් සහ රු. 487,929,754 ක් ලෙස දක්වා තිබුණ ද ශුද්ධ වත්කම් වෙනස් වීමේ ප්‍රකාශනයේ ඉහත අගයන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 | මෙය සිදුවී ඇති මූල්‍ය ප්‍රකාශනයේ කරුණු අනාවරණය කිරීමේදී සිදුවී ඇති වර්ගීකරණ දෝෂයක් පමණක් වන අතර එය දීර්ඝකාලයක සිට මෙලෙස අනාවරණය කර ඇති අතර ඇතැම් ශේෂයන් නිවැරදිව හඳුනාගත හැක.3 | අදාළ පරිදි නිවැරදි කිරීම් කළ යුතුය. |

ප්‍රකාරව වෙනම පෙන්නුම් කිරීමට කටයුතු නොකර එම අගයන් දායක ප්‍රාග්ධනය රු.595,168,179 ක් ලෙසද සමුච්චිත ඌනතාවය රු.76,249,060 ක් ලෙස ද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි අගයන්ට අනුරූප නොවන පරිදි දක්වා තිබුණි.

## 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වය අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i). ණයගැතියන්ගෙන් ණය අයකර ගැනීමට ඇති හැකියාව පිළිබඳ ඇගයීමකින් පසුව ණයගැතියන්ගේ හානිපූර්ණ අගයක් හඳුනා ගැනීමට කටයුතු නොකර ණයගැතියන්ගෙන් වර්ෂ 05 කට වැඩි ණය ශේෂ සඳහා සියයට 100 ක අඩමාන ණය වෙන් කිරීමක් ද අනෙකුත් ණයගැති ශේෂ සඳහා සියයට 50 ත් සියයට 7.5 ක් අතර අඩමාන ණය වෙන් කිරීමක් ද සිදුකර තිබුණි. මේ පරිදි සමාලෝචිත වර්ෂයේ අවසානයට සිදුකර තිබුණු මුළු අඩමාන ණය වෙන් කිරීම රු. 7,696,863 ක් විය. | ආයතනයේ ගනුදෙනු ස්වභාවය මත නිශ්චිත අඩමාන ණය වෙන් කිරීමේ ප්‍රතිපත්තියක් විගණන හා කළමනාකරණ කමිටුව වෙත යොමු කළ ද අනුමැතියක් නොලද අතර අනුමැතිය ලද වහාම කළමනාකරණ මණ්ඩලයට යොමු කර නිශ්චිත ප්‍රතිපත්තියක් සකස් කරනු ලැබේ. | පෙර වර්ෂයේ වාර්තාවේද මෙය දක්වා ඇති බැවින් අදාළ පරිදි කටයුතු කළ යුතුය. |
| (ii). දැනටමත් භාවිතා කරමින් පවතින ආයතනයෙහි මුළුතැන්ගෙයෙහි නවීකරණය සඳහා වැය කර ඇති රු.26,846,285 ක මුදලින් මුළුතැන්ගෙයි උපකරණ හා අළුත්වැඩියා වියදම් අවශ්‍ය පරිදි ඉන්වෙන්ට්‍රි භාණ්ඩ හා අයභාර වියදම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කරනු වෙනුවට නොනිම් වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | කොන්ත්‍රාත්තුව මෙතෙක් නිශ්චිතව අවසන් කර බාර දී නොමැති බැවින් නොනිම් වැඩ ලෙස ගිණුම්ගත කර ඇත. දැනට එය භාවිතයට ගන්නා අතර ඔබගේ නිර්දේශයන් මත ඉදිරියේදී ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කරනු ලැබේ. නිශ්චිතව හඳුනා නොගත් ලැබීම් අවිනිශ්චිතව ගිණුමේ පෙන්වා තිබුණ ද 2022 වර්ෂයේ දී එය නිවැරදි ලෙස ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු කරනු ඇත. | අදාළ පරිදි නිවැරදි කිරීම් කළ යුතුය. |
| (iii). සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු රු.9,563,246 ක පාඨමාලා ගාස්තු ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම වෙනුවට හඳුනා නොගත් තැන්පතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර පහසුකම් සැපයීමේ කුලී ආදායම රු.1,251,450 ක් සමාලෝචිත | බැංකුවට සෘජු ලැබීම ගෙවීම් කවුරුන් විසින් ද කුමන පාඨමාලාවන් සඳහා කරනු ලැබුවේද යන්න නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකි නිසා මෙලෙස ගිණුම්ගත කර ඇත. අදාල පාඨමාලා සම්බන්ධීකාරක ගෙන් හෝ ලේඛකාධිකාරී ගෙන් ලැබෙන නිවැරදි තොරතුරු මත ගිණුම් ගත කිරීම ඉදිරියේදී කටයුතු කරමි. | අදාළ පරිදි නිවැරදි කිරීම් කළ යුතුය. |

වර්ෂයේ ආදායමක් ලෙස හඳුනා නොගෙන අවිනිශ්චිත ගිණුමක රඳවාගෙන තිබූ නිසා වර්ෂයේ අතිරික්තය රු.10,814,696 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 24,437,646 අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 10,778,597 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 35,216,243 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පාඨමාලා ගාස්තු ආදායම වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වය අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i). ශ්‍රී ලංකා පදනමට නීත්‍යානුකූල අයිතිය ඇති පොත් අගය රු.5,283,015 ක් වූ ගොඩනැගිල්ලක් ලිඛිත ගිවිසුමකින් තොරව බාහිර පාර්ශවයන්ට භාවිතය සඳහා ලබා දී තිබුණි. | මෙම දේපළ පවරා ගැනීමට කටයුතු කළත් එය අත්පත් කර ගැනීමට නොහැකි වී ඇත. දැනට මෙම ගොඩනැගිල්ලේ හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය පදිංචිව සිටී. | ගොඩනැගිල්ල පවරා ගැනීමට හෝ අදාළ පාර්ශවයට විධිමත්ව ලබාදීමට හෝ කටයුතු කළ යුතුය. |
| (ii) ශ්‍රී ලංකා පදනම විසින් උසස් ජාතික ඩිප්ලෝමා , ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා සහ විවිධ වැඩමුළු 130 ක් සමාලෝචිත වර්ෂයේදී පවත්වා තිබුණි. ආයතනය තුළ ස්ථිර කථිකාචාර්යවරු 11 ක් සිටින අතර ඔවුන්ට වාර්ෂික වැටුප් හා වෙනත් දීමනා ලෙස රු.15,633,473 ක් සහ බාහිර කථිකාචාර්යවරු සඳහා රු.17,078,356 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. නියැදි පරීක්ෂාවකදී පාඨමාලා සහ වැඩමුළු 94 කින් 67 ක් සඳහා මුළුමනින්ම බාහිර කථිකාචාර්යවරු පමණක් සේවයේ යොදවා තිබූ අතර පාඨමාලා 27 කදී බාහිර කථිකාචාර්යවරුන්ගේ සම්පත් දායකත්වය සියයට 75 ඉක්මවා තිබුණි. ආයතනයේ පාඨමාලා සම්බන්ධීකරණ ඒකකයක් පැවතිය ද පදනමේ ස්ථිර කථිකාචාර්යවරු මෙම පාඨමාලාවල සම්බන්ධීකරණ කටයුතු පමණක් සිදු කර තිබුණි. | ආයතනය පසුගිය වසර කිහිපයක සිට ඩිප්ලෝමා , සහතික පත්‍ර පාඨමාලා , සහතික පත්‍ර පාඨමාලා , පුහුණු වැඩමුළු සියයකට ආසන්න ප්‍රමාණයක් පවත්වාගෙන එනු ලබයි. ඒ ක්ෂේත්‍රයන්ට අදාළ සුදුසුකම් ලැබූ කථිකාචාර්යවරුන් අප ආයතනයේ නැත. දැනට ස්ථිර කථිකාචාර්යවරුන් 09 දෙනෙක් හා අනියම් පදනම මත එක් කථිකාචාර්යවරයකු සේවය කරයි. පාඨමාලා බොහෝමයක් වෘත්තීය සංවර්ධනය හා රැකියා අභිමුඛව පැවැත්වෙන බැවින් කථිකාචාර්යවරුන්ට සියලු විෂයයන් ඉගැන්වීම් සිදු කළ නොහැක. එම නිසා ආයතනයේ අධ්‍යයන අංශය පවත්වාගෙන යාමට බාහිර කථිකාචාර්යවරුන් සම්බන්ධ කරගෙන ඇත. | දැනට ස්ථිර තනතුරුවල නිරතවන කථිකාචාර්ය වරුන්ගෙන් උපරිම සේවය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |